**ශීර්ෂය 267 - මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2015 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අප්‍රේල් 26 දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන සහ රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

(අ) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 262.10 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු. මිලියන 251.39 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 10.71 ක් හෙවත් සියයට 4.09 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 188.63 | 177.97 | 10.66 | 5.65 |
| මූලධන | 73.47 | 73.42 | 0.05 | 0.07 |
| එකතුව | **262.10** | **251.39** | **10.71** | 4.09 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 20 ක් හා දෙපාර්තමේන්තු 11 ක් විසින් එකතුව රු.මිලියන 582.09 ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර ඉන් රු. මිලියන 545.51 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව, ඉතිරිය ලබා දී තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 36.58 ක් හෙවත් සියයට 6.28 ක් වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සිමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

## 2.3 පොදු තැන්පත් ගිණුම

අංක 6003/0000/00/0043/0000/000 දරන පොදු තැන්පත් ගිණුමේ, 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 50.10 ක් විය.

## 2.3 විගණන නිරීක්ෂණය

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-----------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| පොත් නාමාවලිය | කච්චේරි මාර්ගෝපදේශක අත්පොත 5:9 | පවත්වා නොතිබුණි. |
| බැරකම් ලේඛණය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛණය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| ප්‍රසම්පාදන Time Schedule | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 දරන මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| දුරකථන ලේඛණය | මුදල් රෙගුලාසි 845(1), 846(3) | යාවත්කාලීන කර නොතිබුණි. |
| පාඩු පිළිබඳ ලේඛණය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 විසර්ජන ගිණුම

------------------

#### 3.2.1 අයවැය විචලනය

-------------------

විසර්ජන ගිණුම් සැකසීමේදී සංශෝධිත අයවැය ඇස්තමේන්තුව පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණු අතර එහි සඳහන් වටිනාකම්ද ඇතුළත් කර නොතිබුණි. මේ අනුව, පිළිවෙලින් රු.මිලියන 13.00 ක් හා රු.මිලියන 3.00 ක මූලධන වියදම් සහ පුනරාවර්තන වියදම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

### 3.3 අග්‍රිම ගිණුම

--------------

සමාලෝචිත වර්ෂයේදී රු.1,019,696,189 ක අග්‍රිම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණද, මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව, අග්‍රිම ලේඛනය සහ අතුරු අග්‍රිම ලේඛණය විධිමත්ව සහ යාවත්කාලීනව පසුගිය වර්ෂ 2 සඳහා පවත්වාගෙන ගොස් නොතිබුණි. මේ අනුව, ලබාදී තිබුණු මුළු අග්‍රිම ප්‍රමාණය දිස්ත්‍රික්

ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක් අතර කාර්යක්ෂම ලෙස අග්‍රිම වෙන්කිරීම සතුටුදායක ලෙස නිශ්චය කර ගත නොහැකි වී තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 50.10 ක් වූ තැන්පත් ගිණුම් ශේෂයේ වයස් විශ්ලේෂණය විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06කට අදාලව එකතුව රු.මිලියන 21.64 ක් වූ තැන්පතු ශේෂවල විස්තර පසුගිය වර්ෂ 2 ක කාල පරිච්ඡේදය සඳහා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක පොදු තැන්පත් ගිණුම්වල පවතින රු.4,471,121 ක් වූ තනි පුද්ගල ගිණුම් 244 ක තැන්පතු සම්බන්ධයෙන් ඒවා තැන්පත් කිරීමේ හේතු විගණනයට ඉදිරිපත් නොවීය.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

-----------------------------------------

විෂය අංක 26701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය සහ සාමාජික ණය ලේඛණය (CC-10) අතර පැවති රු.59,824 ක වෙනස සැසඳීම සඳහා කිසිඳු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙන නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක පොත්වල පැවැති එකතුව රු.1,567,241ක තනි පුද්ගල ශේෂවල වටිනාකම, රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ විශ්‍රාම ගිය, සේවය අත්හිටවූ, මියගිය හා සේවය හැරගිය වශයෙන් වර්ෂ 8 කට අධික කාලයක සිට විශ්ලේෂණය කර දක්වා නොතිබුණි.

(ඇ) සේවය හැර ගිය, විශ්‍රාම ගිය සහ විනය ක්‍රියාමාර්ගවලට යටත් වූ නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.451,583 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තිය ප්‍රකාර හෝ කටයුතු කර නොතිබුණි.

## 3.6 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

-----------------------------------

### වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කළයුතු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සමබන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත විදුලි උත්පාදක යන්ත්‍රයක් (Generator) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදී තිබූ අතර එය වර්ෂ 02 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. කෙසේ වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නව විදුලි උත්පාදක යන්ත්‍රයක් (502 KVA) 2015 දෙසැම්බර් 23 දින රු.මිලියන 9.80 ක පිරිවැයකට මිලදී ගෙන තිබූ අතර එම යන්ත්‍රය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2016 දෙසැම්බර් මාසයේදී ලැබී තිබුණි. කෙසේ වුවද, විදුලි උත්පාදක යන්ත්‍ර දෙකක් තබා ගැනීමට හේතු, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද විදුලි උත්පාදක යන්ත්‍රයේ පිරිවැය සහ මෙම යන්ත්‍ර සඳහා වන පළපුරුදු යන්ත්‍ර ක්‍රියාකරුවන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙහි මූල්‍ය ප්‍රතිලාභ, ඵලදායිකත්වය සහ මෙම යන්ත්‍රවල නඩත්තුව පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව එහි ගිණුම්වල පෙන්නුම් කරන යතුරු පැදි 17 ක් පිළිබඳ එහි හිමිකාරිත්වය, පැවැත්ම, වටිනාකම සහ ඵලදායී භාවිතය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානය(Food and Agriculture Organization of United Nations) විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2012 සැප්තැම්බර් 03 දින පරිත්‍යාග කරනු ලැබූ යතුරු පැදි 06 ක් සම්බන්ධයෙන් එහි හිමිකාරිත්වය, ලියාපදිංචි අංක, පැවැත්ම, වටිනාකම සහ ඵලදායී භාවිතය පිළිබඳ විස්තර වසර 04 කට අධික කාලයක සිට විගණනය වෙත ඉදිරිපත් නොවීය.

**3.8 අනුකූල නොවීම්**

-------------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------------

නියැදි විගණන පරික්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීතී,රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 94 (2) | 380,880 | වැය විෂයයන් 28 ක් සඳහා ස්වාධීන සනාථකිරීම් ලබාගෙන නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක වාර්තා සහ විසර්ජන ගිණුමේ බැරකම් අතර එකතුව රු.116,782 ක වෙනසක් සමාලෝචිත වර්ෂයේදී නිරීක්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 565(3) | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ පොදු තැන්පත් ගිණුම් තුලනය කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 757 | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් සමාලෝචිත වර්ෂයේදී ගබඩා අයිතමයන් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දුන් පරිදි ක්‍රියාකර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1646 | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති පරිත්‍යාග වශයෙන් ලැබූ මෝටර් වාහන 26 ක් සහ යතුරු පැදි 23 ක් සමාලෝචිත වර්ෂයේදී ගබඩා සමීක්ෂණය සඳහා පත්කරනු ලැබූ සමීක්ෂණ මණ්ඩලය විසින් භෞතික පරීක්ෂාවට ලක්කර නොතිබුණි. |
| **(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006** | | |
| 5.4.1 මාර්ගෝපදේශය | - | එකතු කළ අගය මත බදු ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිටද පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර දන්වා නොතිබුණි. |

**3.9 දේශීය මූලාශ්‍රකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

**(අ) නිශ්චිත අරමුණු සඳහා ව්‍යාපෘති භාවිතා නොකිරීම**

---------------------------------------------------

(i) වැලිඔය ප්‍රාදේශීය ලේකම්වරයා සඳහා නිල වෙසක් (තනි තට්ටුවේ ගොඩනැගිල්ලක්) රු. මිලියන 7.86 ක පිරිවැයකට ඉදිකර තිබුණි. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා සවිකිරීම් අයිතමයන් 135 ක් ද සමඟ 2012 දෙසැම්බර් 14 දින මුලතිව් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත මෙම ගොඩනැගිල්ල භාරදී තිබූ අතර අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් වර්ෂ 04 කට අධික කාලයක සිට අදාළ අරමුණු භාවිතා නොකර නිෂ්කාර්යව තබා තිබුණි.

(ii) අනාරක්ෂිත හා අතවරයන්ට ලක්වූ ළමුන් සඳහා මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ජාතික ළමාරක්ෂක අධිකාරිය ලබාදුන් රු. මිලියන 24.19ක ආධාර මත ආරක්ෂක මධ්‍යස්ථානයක් මුලතිව්, සෙල්වපුරම්හි ඉදිකර තිබුණි. ඉන්වෙන්ට්‍රි අයිතම 481 ක් හා සවිකිරීම් ද සමග දිස්ත්‍රික් ලේකම්වරයාට මෙම මධ්‍යස්ථානය 2014 දෙසැම්බර් 26 දින භාරදී තිබුණත් වර්ෂ 02කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. කෙසේ වුවද, ශක්‍යතා වාර්තා, අනාරක්ෂිත හා අතවරයන්ට ලක්වූ දරුවන් පිළිබඳ විස්තර සහ මධ්‍යස්ථානයේ ඵලදායි උපයෝජනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.10 අධිකාරි බලය නොවූ ගනුදෙනු**

------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකු ලෝක ආහාර වැඩසටහනෙහි රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් රු. 167,534ක මුදලක් විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශයෙන් ලද අග්‍රිම මුදලින් ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද, 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලද පත්වීමේ ලිපියක් හෝ නිදහස් කිරීමේ ලිපියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.11 කළමනාකරණ දූර්වලතා**

----------------------------

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව විසින් පත්කරනු ලැබූ කොන්ත්‍රාත්කරු විසින් ඉදිකරන ලද නව ගොඩනැගිලි සංකීර්ණයේ I අදියර 2014 ජූලි 29 දින මුලතිව් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත භාර දී තිබුණි. මෙම ගොඩනැගිල්ල සහ එහි ඉදිකිරීම්වල පිරිවැය වර්ෂ 02කට අධික කාලයක සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. කෙසේ වුවද, ගොඩනැගිල්ල භාරගැනීමෙන් අනතුරුව එහි ඉරිතැලීම් කිහිපයක් දක්නට ලැබුණු අතර අලුත්වැඩියාවන් සහ නවීකරණය කිරීමේ කටයුතුද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුදලින් සිදුකර තිබුණි. මෙම ගොඩනැගිල්ලේ බිම ටයිල් ඇතිරීමේ කටයුතු හැර අනෙකුත් අලුත්වැඩියාවන් සහ නවීකරණය කිරීමේ කටයුතු සිදුකර තිබුණත් ගොඩනැගිල්ලේ පිරිවැය සහ කොන්ත්‍රාත් කාලය නිගමනය කළ හැකි ලිපිගොනු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.12 පාඩු

------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු රු. මිලියන 298.9 ක වටිනාකමින් යුත් අයිතමයන් 35ක නැතිවීම් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව කටයුතු කරන ලෙස දන්වා තිබුණි. මේ පිළිබඳව කිසිඳු කටයුත්තක් වර්ෂ 01 මාස 10 කට අධික කාලයක සිට සිදු කර නොතිබුණු අතර අදාල රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාටද මේ පිළිබඳව දන්වා නොතිබුණි. කෙසේ වුවද මෙම පාඩුවල වටිනාකම පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ හෝ පොත්වලින් කපාහැරීම් යටතේ සමාලෝචිත වර්ෂයේදි දක්වා නොතිබුණි.

(ආ) රාජකාරි වාහනයකට 2014 නොවැම්බර් 28 දින සිදු වූ රු. 227,926 ක පාඩුව විසර්ජන ගිණුම්වලට ඇතුළත් කර නොතිබූ අතර වර්ෂ 02කට අධික කාලයක සිට මුදල් රෙගුලාසි 104(2) ප්‍රකාරව ගනු ලැබූ ක්‍රියාමාර්ග ද වාර්තා කර නොතිබුණි.

## 3.13 නොවිසඳු විගණන ඡේද

------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව පසුගිය වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් මෙතෙක් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2014 | 3.12 | අභ්‍යන්තර විගණන පරීක්ෂණවලින් ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2013 ජූලි සිට 2014 පෙබරවාරි දක්වා<br><br>කාලය තුළ UNICEF ආධාර මත පන්ඩාරවන්නියන් ග්‍රාම සංවර්ධන සමිතිය සමග එළඹ තිබූ ගිවිසුම ප්‍රකාරව ඉදිකරනු ලැබූ මහජන වැසිකිළි පද්ධතිය සම්බන්ධයෙන් එකතුව රු. මිලියන 2.71ක වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ වාර්තා කර තිබුණි. මේ සම්බන්ධයෙන් අදාල ගිවිසුමේ පිටපතක්, භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ දක්වා ඇති පරිදි සීමාව ඉක්මවා එළඹ තිබූ රු. මිලියන 10.57ක කර්මාන්තවලට හේතු, කර්මාන්තයේ ප්‍රගතිය, බැංකු ගිණුම්වල විස්තර සහ වරින්වර සිදුකරන ලද සුපරීක්ෂණ කටයුතු සහ අධීක්ෂණයන්ගේ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර වර්ෂ 04කට අධික කාලයක් දක්වා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

**3.14 මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 26 | 19 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 18 | 02 | 16 |
| (iii) | ද්විතියික මට්ටම | 345 | 210 | 135 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 46 | 42 | 04 |
| | **එකතුව** | **435** | **273** | **162** |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 162 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.